www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපති, උත්සන්න කෙරුනු යුද්ධය සඳහා සූදානම් වීමේ ත්‍රස්ත විරෝධී නීති යලි පනගන්වයි

## Sri Lankan president reimposes anti-terror laws in preparation for intensified war

**සමාජවාදී සමානතා පක්ෂය විසිනි**
**2006 දෙසැම්බර් 9**

බදාදා රාත්‍රියෙහි රූපවාහිනියෙන් ජාතිය ඇමතූ ජනාධිපති මහින්ද රාජපක්ෂ, කුප්‍රකට ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත (පීටීඒ) යලි පනගන්වන බව නිවේදනය කලේ ය. දෙමල විමුක්ති කොටි සංවිධානය (එල්ටීටීඊ) සමග 2002 දී අත්සන් තැබූ සටන් විරාම ගිවිසුමෙන් පසුව බල රහිත වූ පීටීඒ මගින්, "ත්‍රස්තවාදී සැකකරුවන්" නඩු විභාගයකින් තොරව අත්අඩංගුවට ගෙන ප්‍රශ්න කිරීමේ පුලුල් බලතල ආරක්ෂක හමුදාවන්ට හිමි විය.

කෙසේ වුව ද රාජපක්ෂ, මෙම පොලිස් රාජ්‍ය බලතල යලි බලගැන්වීමට වඩා දුර ගියේ ය. ඔහුගේ නිවේදනය, එල්ටීටීඊයට එරෙහිව යලි ඇරඹූ යුද්ධය, තව දුරටත් අවුලුවා ලීම සඳහා සූදානම් වීමේ දී සියලු ප්‍රජාතන්ත්‍ර අයිතීන්ට එල්ල කෙරෙන දුරදිග යන ප්‍රහාරයකට සමාන වේ. ඔහු එක එල්ලේ ප්‍රකාශ කලේ ත්‍රස්තවාදය පරාජය කිරීමේ දී ප්‍රජාතන්ත්‍රවාදය එයට නොගැලපෙන බවයි. "ත්‍රස්තවාදයට මග පෑදූ ප්‍රජාතන්ත්‍රවාදය විහිලුවකි. එය පොඩි විහිලුවක් නොව මාරාන්තික විහිලුවකි."යි ඔහු පැවසීය.

"ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයේ" තමාගේ ම යෙදුම සුජාතකරනය සඳහා රාජපක්ෂ, බුෂ් පරිපාලනයේ මදාවිකාරයන්ට ආයාචනා කිරීම ද කැපී පෙනෙයි. එක්සත් ජනපදයමෙන් ම තවත් බොහෝ රටවල් ද අද; ත්‍රස්තවාදයේ අභියෝගයන්ට මුහුනපා සිටියි. එම රටවල් ත්‍රස්තවාදය ප්‍රජාතන්ත්‍රවාදය සමග පටලවා නොගන්නා අතර "එය මුලුමනින්ම පරාජය කිරීම හැර, අපට වෙනත් මගක් ඉතිරිවී නැතැ"යි ද ඔහු කියා සිටියේ ය.

රටේ ආරක්ෂක ලේකම් මෙන් ම, ජනාධිපතිගේ සොහොයුරා වන, ගෝඨාභය රාජපක්ෂ ඉලක්ක කර ගෙන දෙසැම්බර් 1 දින කොලඹ මධ්‍යයේ සිදු වූ මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරය, පීටීඒ යලි පනපෙවීමේ ආසන්නතම හේතුව විය. ආරක්ෂක ලේකම් ට හානියක් සිදු නොවූ අතර සොල්දාදුවන් දෙදෙනෙක් මියගියහ. බෝම්බ ප්‍රහාරය සිදු වූයේ, එල්ටීටීඊ නායක වී. ප්‍රභාකරන් ආන්ඩුව හෙලා දක 2002 සටන්විරාම ගිවිසුම "අභාවයට" ගොස් ඇති බව ප්‍රකාශ කිරීමෙන් දින කිහිපයකට පසුව ය.

බෝම්බ ප්‍රහාරය එල්ල කලේ එල්ටීටීඊය බව බෙහෙවින් ම පැහැදිලි වන අතර, පසුගිය වසර පුරා එල්ටීටීඊයට එරෙහි යුද්ධය ප්‍රකෝපකාරී ලෙස අවුලුවා ලූ රාජපක්ෂ හා ඔහුගේ ආන්ඩුව මත දේශපාලන වගකීම මුලුමනින්ම රැඳී ඇත. ජූලි මාසයේ පටන් මිලිටරිය 2002 සටන් විරාමය විවෘතව උල්ලංඝනය කරමින් එල්ටීටීඊ පාලන ප්‍රදේශ අල්ලාගැනීමේ සාහසික ප්‍රහාර මාලාවක් ගෙන ගියේ ය. මුල්ලකට හිරවූ එල්ටීටීඊය, සහන ලබා ගැනීම සඳහා ආන්ඩුවට බලකෙරෙන මංමුලාසහගත පහරකට යොමු විය.

ප්‍රහාරය, කෙලින් ම යොමු වූයේ ආන්ඩුවේ වාසියට ය. ඇමතිවරු ද, මාධ්‍ය ප්‍රකාශකයන් ද වහාම, "කොටි ත්‍රස්තවාදීන්" හෙලාදකිමින් පීටීඒ යලි පනවන ලෙස ඉල්ලා සිටියහ. සිංහල අන්තවාදී ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) හා ජාතික හෙල උරුමය (ජේඑච්යූ) එල්ටීටීඊය තහනම් කරන ලෙසත්, සටන් විරාමය කටු ගා දැමීම හා එල්ටීටීඊයට එරෙහි පූර්න යුද්ධයක් සඳහා බල කෙරෙන රැස්වීම් හා විරෝධතාවන් ට එලඹුනහ.

ඝාතනයට ලක් වූ ආන්ඩුවේ නායකයන්ගේ හා දේශපාලනඥයන්ගේ දිගු ලැයිස්තුවක් ඉදිරිපත් කරමින් රාජපක්ෂ, සිය කථාව තුල එල්ටීටීඊය "ත්‍රස්තවාදීන්" ලෙස හංවඩු ගැසීම සුජාත කලේ ය. කෙසේ වුවද ඔහු, එල්ටීටීඊය පැන නැගීම ද, ධනපති ඊලම් රාජ්‍ය කැබැල්ලක් සඳහා එහි ඉල්ලීම ද පිලිබඳව කිසිවක් පැහැදිලි නොකිරීම පුදුමයක් නොවේ. විසි වසරකට වැඩි කලක් ගැටුම අවුලුවා ලූ සිංහල අධිපතිවාදයේ වාර්ගික දෘෂ්ටිවාදයේ හා දෙමල විරෝධී වෙනස්කම් කිරීමේ පදනම මත, සිය පූර්වගාමීන් මෙන්ම රාජපක්ෂ ආන්ඩුව ද පිහිටා සිටියි.

දෙමල සුලුතරය මැඩීම හා පීඩාවට පත් කිරීම පිලිබඳව ආරක්ෂක හමුදාවත් නම් දරා සිටියි. මීට පෙර පීටීඒ යටතේ දහස් ගනන් දෙමල වැසියන් කොටු කර

නඩු විභාගයකින් තොරව දින නියමයක් නොමැතිව රඳවා ගත් අතර, බොහෝවිට වධ දීමට ද ලක් කලේ ය. පසු ගිය වසර පුරා, දිවයිනේ උතුරු හා නැගෙනහිර දී සිය ගනනක් දෙමල වැසියන්, මිලිටරිය හා එයට සම්බන්ධ පැරා මිලිටරි කොටස් විසින් සංවිධානය කල ඝාතක කල්ලි විසින් පැහැර ගෙන ගොස් මරාදැමූ බව නොරහසකි.

රාජපක්ෂ, එල්ටීටීඊය නිල වසයෙන් තහනම් කර නැති අතර සාම කථා සඳහා දොර විවෘතව ඇති බව ඔහුගේ කථාවේ දී සඳහන් කලේ ය. මෙසේ පෙනී සිටීමට හේතුව, තව දුරටත් ජාත්‍යන්තර විශේෂයෙන්ම එක්සත් ජනපදයේ සහාය ලබා ගැනීමේ අවශ්‍යතාවයි. රාජපක්ෂගේ ප්‍රතිපත්ති සඳහා වොෂින්ටනයේ පිටුබලය, එක්සත් ජනපදයේ නියෝජ්‍ය රාජ්‍ය ලේකම් නිකොලොස් බර්න්ස් විසින් පසු ගිය මාසයේ දී මෙසේ ප්‍රකාශ කලේ ය. "එක්සත් ජනපද ආන්ඩුව මධ්‍යස්ථව නොසිටියි. අප ශ්‍රී ලංකාවේ ආන්ඩුව සමග, ත්‍රස්තවාදය සේ ම එය වැඩී යාමද මැඩපැවැත්වීමේ දී සහකරුවෙක් ලෙස කටයුතු කරමින් සිටිමු."

සටන් විරාමයට බැඳී සිටින්නේ ය යන රාජපක්ෂගේ ප්‍රකාශයන් අභූතයකි. පීටීඒ යලි පැනවීම මත් සටන් විරාමය විවෘතව උල්ලංඝනය කිරීමකි. මෑත මාසවල දී එල්ටීටීඊයෙන් අල්ලා ගත් භූමි භාගයන් යලි පැවරීමේ කිසිදු අදහසක් ආන්ඩුවට හෝ මිලිටරියට ඇත්තේ නැත. සාමයේ නාමයෙන්, පූර්න පරිමාන යුද්ධයකට රට යලි ඇද දැමීම ඔහුගේ අදහස බව ජනාධිපතිගේ කථාවෙන් සක්සුදක් සේ පැහැදිලි ය . "නව ශ්‍රී ලංකාවක් ගොඩනැගීමෙහි ලා අප ගන්නා සියලු පියවරයන් සාර්ථක කර ගත හැක්කේ, මෙම මෘග ත්‍රස්තවාදය පරාජය කිරීමෙන් පමනකි."

## ප්‍රජාතන්ත්‍රීය අයිතීන්ට නව ප්‍රහාරයන්

නව යුද්ධය, හුදෙක් 2002 ට පෙර අවධිය කරා ආපසු යෑමක් නො වේ. සවිය අතින් බොහෝ දුබලව සිටින රාජපක්ෂ ආන්ඩුව, පැතිර පවතින යුද විරෝධී මනෝ ගතියට මෙන් ම ආර්ථික ප්‍රතිපත්තීන් විසින් ජීවන තත්වයන් මත ඇතිකර තිබෙන ප්‍රතිවිපාකයන් කෙරෙහි විරෝධයකට ද දැනටමත් මුහුන පා සිටියි. මෑත අයවැය ඉදිරිපත් කරමින් ඔහු කියා සිටියේ, " ත්‍රස්තවාදය" පරාජය කිරීම සඳහා වැඩ කරන ජනතාව කැප කිරීම් කලයුතු බවයි.

ජාතික එකමුතුව සඳහා බඳාදා ඔහු කල කැඳවීම තුල රාජපක්ෂ, ප්‍රතිරාවය කල එක්සත් ජනපද ජනාධිපති බුෂ්ගේ කුප්‍රකට සඳහන එනම් "ඔබ අප සමග ය නැතහොත් අපට විරුද්ධවය" යන්න පිලිකුල් සහගත ය. "සියලු දේශපාලන පක්ෂ, සියලු මාධ්‍ය හා සියලු ජනතා සංවිධාන" අමතා ඔහු කියා සිටියේ "ඔබ සිටිය යුත්තේ අතලොස්සක්වන ත්‍රස්තවාදීන් සමග ද නැතහොත් බහුතරයක් වන සාමාන්‍ය මිනිසා සමග ද යන්න ඔබ තීරනය කරන්න. ඔබ තෝරා ගත යුත්තේ මේ දෙපැත්තෙන් එකකි. එකම විටෙක මේ දෙපැත්තම නියෝජනය කිරීමට කිසිවෙකුටත් නොපුලුවන."

දේශපාලන හා මාධ්‍ය සංස්ථාපිතය දැනටමත් පීටීඒ හා යුද්ධයේ මාවතට පිවිස සිටියි.

ආන්ඩුවේ ප්‍රතිගාමී ආර්ථික ක්‍රියාවලියට හෝ යුද්ධයට එරෙහිවන කවරෙකුට හෝ රාජපක්ෂ පැහැදිලිවම තර්ජනය කරයි. පීටීඒ යටතේ පොලිසියට හා හමුදාවට, "ත්‍රස්තවාදයේ" සැකය මත ඕනෑ ම අයෙකු නඩු විභාගයකින් තොරව තෙමසක් රඳවා ගත හැකි කුරිරු බලතල හිමිවේ. රඳවා තබාගැනීමේ කාලය මාස 18ක් දක්වා දීර්ඝ කල හැකිය. ඉන් පසුව පැවැත්වෙන මහාධිකරන නඩු විභාගය ජූරි සභාවකින් තොර වන අතර පාපෝච්චාරනයන් සාක්ෂ්‍ය ලෙස ඉදිරිපත් කෙරේ. නිදොස් භාවය ඔප්පු කිරීමේ වගකීම රැඳවියා මත පැටවේ.

මහ ජනතාව ඒත්තු ගැන්වීමට රාජපක්ෂ මහත් වෙහෙසක් දරයි. "මෙම නීති රීති කම්හලේ, ගොවිබිමේ හා සරසවියේ කිසිදු අයිතියකට බලපාන්නේ නැත. මෙම නීති මගින් කුමන ආකාරයක හෝ මිනිස් අයිතිවාසිකම් කඩ වීමට මම ඉඩ නොතබමි."යි ඔහු කියා සිටියේ ය. එහෙත් පීටීඒ හි ඉතිහාසය රහසක් නො වේ. එය, එල්ටීටීඊ සැකකරුවන්ට පමනක් නොව, 1980 ගනන් අග භාගයේ දිවයිනේ දකුනු ප්‍රදේශවල සිංහල තරුනයන්ට එරෙහිව ද එකසේ යොදා ගෙන තිබේ.

තවද, ත්‍රස්තවාදී කටයුතු "ප්‍රචාරය කිරීම, අනුබල දීම, ආධාර කිරීම, උපදෙස් දීම හෝ සහාය දීම" නීති විරෝධී කල හැකි වන පරිදි ත්‍රස්තවාදය පිලිබඳ නිර්වචනයට විස දල සවිකර තිබේ. ජාතික ආරක්ෂාවට හා සිවිල් ජනතාවට තර්ජනයක් වන, පොදු කටයුතුවලට හෝ ඒවායේ අලුත්වැඩියාවට, සැපයුම්වලට සේවාවන්ට තර්ජනයක්වන, දේපලවලට හානි සිදු කිරීම හෝ විනාශ කිරීම හෝ ජනතාවගේ සෞඛ්‍යය හා ආරක්ෂාවට අනතුරුදායක වන පරිදි ප්‍රචන්ඩත්වය හෝ තර්ජනය යොදා ගන්නා කුමන හෝ ක්‍රියාවක් "ත්‍රස්තවාදී" යයි දැන් නිර්වචනය කෙරේ. අත්අඩංගුවට ගෙන රඳවාගැනීමට සම්බන්ධ නිලධාරින්ට පීටීඒ මගින් නීතිමය රැකවරන සැලසේ.

තර්ජනයක් ලෙස ආන්ඩුව විසින් සලකනු ලබන ඕනෑ ම අයෙකුට එරෙහිව පීටීඒ යොදා ගනු ඇති බව නිසැක ය. "ත්‍රස්තවාදයට" උදව් දීම හා ප්‍රචාරය කිරීමට එරෙහි නව රෙගුලාසි, මාධ්‍යයට, ආන්ඩුවේ විවේචකයන්ට හා දේශපාලන විරුද්ධවාදීන්ට එරෙහිව උපයෝගී කර ගත හැකි හා කර ගනු ඇත.

"ත්‍රස්තවාදය" පිලිබඳ වියුක්ත අර්ථකථනය, වැඩ වර්ජනය කරන කම්කරුවන්ට හෝ විරෝධතාවේ යෙදෙන ශිෂ්‍යයන්ට හා ගොවීන්ට එරෙහිව

ලෙහෙසියෙන්ම යොදාගත හැකි ය. පසු ගිය වසර පුරා, සිය රැකියා හා ජීවන කොන්දේසි රැකගැනීමේ කාර්මික අරගලවලට පිවිසීමෙන් රාජ්‍ය අංශයේ, සෞඛ්‍ය අංශයේ ඛනිජතෙල් හා වරායේ කම්කරුවන් "ත්‍රස්තවාදී කටයුතුවල" යෙදෙන්නේ ය යන චෝදනාව, ව්‍යාපාරික කොටස් හා මාධ්‍ය මගින් යලි යලිත් එල්ල කර තිබේ. මේ වන විට රටේ තේ හා රබර් වැවිලි අංශයේ ලක්ෂ ගනනක් ග්‍රාමීය කම්කරුවන් වැටුප් වැඩි කර ගැනීමේ ඉල්ලීම මත වැඩ වර්ජනය කර සිටිති.

සමාජවාදී සමානතා පක්ෂය (සසප) සිංහල දෙමල හා මුස්ලිම් සියලු වැඩ කරන ජනතාවගෙන් ඉල්ලා සිටින්නේ, යුද්ධය ඇවිලවීමේ ද පීටීඒ ද ඇතුලත් ආන්ඩුවේ සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධී පියවරයන්ට විරුද්ධවන ලෙසයි. සාමාන්‍ය වැඩ කරන ජනතාවගේ අවශ්‍යතාවන් හා අපේක්ෂාවන් ඉටුකරලිය නොහැකි රාජපක්ෂ ආන්ඩුව වාර්ගික ද්වේශය ඇවිස්සීමෙහි යෙදී සිටින්නේ, කම්කරු පන්තිය බෙදීමටත් ඕනෑ ම විරුද්ධත්වයක් මැඩීමටත්, යුද්ධය යලි ඇවිලවීමේ මාවත සකසා ඇත.

සිංහල අධිපතිවාදයත් දෙමල බෙදුම්වාදයත් යන ජාතිකවාදයේ හා ස්වෝත්තමවාදයේ සියලු රූපාකාරයන් ප්‍රතික්ෂේප කිරීමත්, සියලු මූලික ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් ආරක්ෂා කිරීමත්, යුද්ධයට එරෙහි අරගලයේ ආරම්භක ලක්ෂ්‍යයයි. යුද්ධයේත් සමාජ අසමානතාවයේත් මූලය වන වර්තමාන ලාභ ගැරීමේ පද්ධතිය අහෝසි කිරීමේ පොදු පන්ති අවශ්‍යතාවයක්, තමන්ගේ වාර්ගික මූලයන් භාෂාව හෝ ආගම් කවරක් වුවත් කම්කරුවන් බෙදාහදා ගනිති. වර්තමාන බංකොලොත් සමාජ පර්යායට සමාජවාදී විකල්පයක් සඳහා පාලක පැලැන්තියේ සියලු පක්ෂවලින් ස්වාධීන වූ වැඩ කරන ජනතාවගේ මහා දේශපාලන ව්‍යාපාරයක් ගොඩනැගීම පිනිස සසපය උද්ඝෝෂනය කරයි. අප කම්කරුවන්ගෙන් තරුනයන්ගෙන් හා බුද්ධිමතුන්ගෙන් ඉල්ලා සිටින්නේ අපගේ දේශපාලන ඉදිරි දර්ශනය හදාරන ලෙසත් *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* කියවන ලෙසත් සසපය ගොඩනැගීම සඳහා එක්වන ලෙසත් ය.

© www.wsws.org